# කියවීම් ද්‍රව්‍යය

# 10 ශ්‍රේණිය

# ඉතිහාසය



## ඒකකය 1

## ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය





## මූලාශ්‍රය වර්ගීකරණය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය



## මූලාශ්‍රය හැඳින්වීම

අතීත මිනිසා කළ කී දෑ හා අතීතයේ සිදු වූ සියලුම දෑ ඉතිහාසයට අයත් වේ. ඉතිහාසය අධ්‍යයනය කිරීම යනු ඒ අතීත මානවයා කළ කී දෑ හා අතීතයේ සිදුවූ දෑ පිළිබඳව අධ්‍යයනය කිරීමයි. එහි දී ඒ පිළිබඳව ලැබෙන තොරතුරු මත පිහිටා ඉතිහාසය ගොඩනඟනු ලැබේ. ඉතිහාසය අධ්‍යයනය කිරීම සඳහා තොරතුරු ලබාගත හැකි ඕනෑම දෙයක් ඓතිහාසික මූලාශ්‍රය නමින් හැඳින්වියහැකි වේ.අතීත මිනිසා කළ කී දෑ හා අතීතයේ සිදුවූ දෑ ඒ ඒ අවධි වල ජීවත් වූ මිනිසා විසින් විවිධ මාධ්‍ය වල ලියා තබන ලදී. එම ලේඛන හා අතීත මිනිසා විසින් නිමවා අද ශේෂව පවතින නිර්මාණ මගින් අතීතය පිළිබඳ බොහෝ තොරතුරු ලබාගත හැකිය.එසේ තොරතුරු ලබාගත හැකි දේ මූලාශ්‍රය ලෙස සලකනු ලැබේ. එම මූලාශ්‍රය මඟින් එම මූලාශ්‍රය නිර්මාණය වූ කාලයට සමකාලීන තොරතුරු අනාවරණය කරගත හැකිය.

## මූලාශ්‍රය වර්ගීකරණය

ඉතිහාසය හැදෑරීමේ දී තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය විවිධ ලෙස වර්ගීකරණය කළ හැකිය. අපගේ අධ්‍යාපනික අවශ්‍යතාවයට ගැළපෙන ලෙස මූලාශ්‍රය සරල ආකාරයට පහත සඳහන් අයුරින් වර්ගීකරණය කර ගැනීම ප්‍රමාණවත් වේ.

### ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය

- සාහිත්‍ය මූලාශ්‍රය
  - දේශීය සාහිත්‍ය මූලාශ්‍රය
    - ගද්‍ය
    - පද්‍ය
  - විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය
- පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය
  - අභිලේඛන
  - කාසි
  - නටබුන්
  - චිත්‍ර/මූර්ති/කැටයම්

| ගද්‍ය | පද්‍ය | අභිලේඛන | කාසි | නටබුන් |
|---|---|---|---|---|
| වංස කතා | මහා කාව්‍ය | සෙල්ලිපි | රං | ආගමික |
| අටුවා | දූත කාව්‍ය | බිත්ති | රිදී | ආගමික නොවන |
| නිඝණ්ඩු | ප්‍රශස්ති | තඹපත් | තඹ | |
| උපදේශ | උපදේශ | රන් තහඩු | | |
| වෛද්‍ය | හටන් | ඇව | | |
| ශිල්ප | දහම් කවි | මැටි පුවරු | | |
| | | භාජන | | |





# දේශිය සාහිත්‍ය මූලාශ්‍රය

ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී තොරතුරු ලබාගත හැකි ස්වදේශිකයන් විසින් රචනා කරන ලද පොත් පත් සියල්ලම දේශීය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස හැඳින්විය හැකිය. විවිධ අරමුණු ඔස්සේ ගද්‍ය පද්‍ය වශයෙන් රචනා කරන කෘති සියල්ල මෙයට ඇතුළත් වේ. අතීතයේ දී පොත් පත් රචනා කිරීමේ දී බහුල ලෙස පුස්කොළ පොත් භාවිත කර ඇත.

# විදේශිය සාහිත්‍ය මූලාශ්‍රය

ලංකා ඉතිහාසය හැදෑරීමේ දී තොරතුරු ලබාගත හැකි විදේශිකයන් විසින් රචනා කරන ලද කෘති සියල්ලම විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස හැඳින්විය හැකිය. ඇතැම් විදේශියන් ලංකාවට පැමිණ ලංකාවේ තොරතුරු දැසින් දැක බලා එම තොරතුරු රචනා කර ඇති අතර ඇතැම් විදේශිකයන් කිසි දිනක ලංකාවට නොපැමිණ, ලංකාවට පැමිණි අයගෙන් හෝ ලංකාවෙන් එම රටවලට ගිය පුද්ගලයන්ගෙන් තොරතුරු අසා දැනගෙන හෝ ලංකාව පිළිබඳ ලියන ලද පොත්පත් කියවා තොරතුරු රැස් කරගෙන තම කෘතිය රචනා කර ඇති අතර මෙම දෙයාකාරයටම රචනා කරන ලද කෘති ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී ඉතා වැදගත්වේ.

# පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය

ඉතිහාසය හැදෑරීමේදී තොරතුරු ලබාගත හැකි සාහිත්‍ය මූලාශ්‍රය හැරුණු කොට අනෙකුත් සියලුම දේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ලෙස හැඳින්විය හැකිය. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය නැවත අභිලේඛන, කාසි , නටබුන් හා චිත්‍ර මූර්ති කැටයම් ලෙස වර්ගීකරණය කළ හැකිය.







# අභිලේඛන

ගල් , බිත්ති , තහඩු , දැව , මැටි පුවරු හා භාජන වැනි විවිධ පෘෂ්ඨයන් මත රචනා කර ඇති ලේඛන , අභිලේඛන ලෙස හැඳින්විය හැකිය. ලේඛනය රචනා කර ඇති පෘෂ්ඨය අනුව අභිලේඛන වර්ගීකරණය කළ හැකිය.

# කාසි



ඈත අතීතයේ සිටම වෙළෙඳාම් හා ගණු දෙනු කටයුතු වලදී ශ්‍රී ලාංකිකයන් විවිධ ලෝහයන්ගෙන් නිපදවන ලද කාසි භාවිතා කර ඇත. කාසි මඟින් ඉතිහාසය පිළිබද බොහෝ තොරතුරු ලබාගත හැකි අතර කාසි පිළිබඳව අධ්‍යයනය කිරීම අද විද්‍යාවක් දක්වා දියුණු වී ඇත. කාසි පිළිබඳව අධ්‍යයනය කරනු ලබන විද්‍යාව නාණක විද්‍යාව ලෙස හඳුන්වනු ලැබේ.

# චිත්‍ර/මූර්ති/කැටයම්

අතීත ශ්‍රී ලාංකිකයා විවිධ අරමුණු ඇතිව විවිධ මාධ්‍ය උපයෝගී කරගෙන චිත්‍ර , මූර්ති , කැටයම් නිර්මාණය කර ඇත. අතීත වැසියා නිර්මාණය කරන ලද නිමැවුම් මඟින් එම නිර්මාණය සිදු කරන ලද කාල වකවානුවට අයත් බොහෝ ඓතිහාසික තොරතුරු අනාවරණය කරගත හැකිය.







